**මැදගම ප්‍රාදේශීය සභාව**
**මොණරාගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 12 වැනි දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 24 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 සැප්තැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව මැදගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මැදගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.**

(අ) දීර්ඝ කාලයක සිට පරිග්‍රහණ ලේඛනවලට ඇතුලත් කර තිබූ මිල නොකල පොත් 1,023 ක වටිනාකම සොයා බලා ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී මහ නැගුම සංවර්ධන වැඩ සටහන යටතේ ව්‍යාපෘති 7 වෙනුවෙන් ලැබිය යුතු කර්මාන්ත ආදායම් රු.6,051,635 ක් ගිණුම් ගතකර නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.21,664,561 ක වත්කම් හා රු.1,028,900 ක වගකීම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,497,810 ක් වූ අතර ,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,948,773 ක් විය.

### 2.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව තථ්‍ය ආදායම් හා වියදම් සහ ඇතැම් අය සහ වැය ශීර්ෂයන් අතර සියයට 20 සිට සියයට 140 දක්වා විචලනයක් පැවති හෙයින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 215 | 240 | 589 |
| (ii) | බදු කුලී | 4,407 | 4,980 | 23 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 705 | 705 | - |
| (iv) | වෙනත් ආදායම් | 159 | 223 | 26 |

**2.3.2 බදු කුලී**

1993-1999 කාල සීමාව තුල සභාව සතු මස් කඩ හා සතිපොල බදුගත් බදුකරුවන් 18 දෙනෙකුගෙන් නිසි පරිදි බදු මුදල් අයකර නොගැනීම හේතුවෙන් සභාවට අයවිය යුතු හිඟ බදු රු.538,108 ක් හා ප්‍රමාද ගාස්තු රු.109,764 ක් අයකරගෙන නොතිබුණි.

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| (i) උසාවිදඩ | 1,272,746 |
| (ii) මුද්දර ගාස්තු | 77,766 |

**2.4 අධිභාර**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුලදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.43,923 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**2.5 නිශ්ක්‍රීය භෞතික සම්පත්**

වාහනයක්, ජලනල උපකරණ විෂයයන් 1,369 ක් සහ ඇල්කතින් අඟල් 2 බට රෝල් මීටර 803.7 ක් නිශ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

**2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2006 අප්‍රේල් 10,2006 මැයි 26,2006 අගෝස්තු 01 හා 2007 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28,28(i),28(ii) හා අංක 36 ට පටහැනිව සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (i) වගන්තිය ප්‍රකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතියක් නොමැතිව සුළු සේවකයන් 12 දෙනෙකුට පත්වීම් ලබා දී තිබුණි.

## 2.7 අවිධිමත් ගනුදෙනු

මෝටර් ග්‍රේඩරයට හා ඩෝසරයට ඉන්ධන සැපයීම හා සේවා ගාස්තු වශයෙන් අවස්ථා 10 කදී ගෙවා තිබුණ රු.831,916 ක් සඳහා කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) ආදායම් පරිපාලනය